# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2496/28 - 2026 ජූලි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2026.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක - 99

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

12(2) වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් දේශීයව නිෂ්පාදනය කරන පහත සඳහන් කරනු ලබන ප්‍රමිති පිරිවිතරවලින් ආවරණය වන භාණ්ඩ වර්ග, කිසිම නිෂ්පාදකයෙකු, අසුරන්නෙකු, බෙදාහරින්නෙකු, ප්‍රවාහනය කරන්නෙකු, ගබඩා කරන්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීම, ඇසිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධානය කරනු ලැබේ.

එසේම, ආනයනය කරනු ලබන පහත සඳහන් ප්‍රමිති පිරිවිතරවලින් ආවරණය වන භාණ්ඩ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 1987 අංක 28 හා 1985 අංක 48 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වන වගන්තිය යටතේ ප්‍රකාශිත 2006 ආනයන (ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය) රෙගුලාසි යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ පරීක්ෂා කර විකිණීම සඳහා අනුමත කර ඇත්නම් මිස, කිසි ම ආනයනකරුවෙකු, අසුරන්නෙකු, බෙදාහරින්නෙකු, ප්‍රවාහනය කරන්නෙකු, ගබඩා කරන්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එකී භාණ්ඩ ආනයනය කිරීම, ඇසිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවටත් මෙයින් විධානය කරනු ලැබේ.

1A - PG 7799 — 53 (2026/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(i) එක්වරක් පමණක් භාවිතා කළ හැකි සනීපාරක්ෂක තුවා Sri Lanka Standard Specification for Single use sanitary towels (SLS 1732)

(ii) එක්වරක් පමණක් භාවිතා කළ හැකි සිහින්/තුනී සනීපාරක්ෂක තුවා Sri Lanka Standard Specification for singel-use ultra-thin/slim sanitary towels (SLS 1748)

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ඉහත සඳහන් ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඉදිරියේදී සිදුකරන ලබන සියලු සංශෝධනයන්ට මෙම විධානය යටත් වේ.

මෙම විධානය 2026 ඔක්තෝබර් මස 08 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**එස්. එම්. ඩී. සූරියකුමාර,**
සභාපති (*වැ. බ.*).

2026 ජුලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.